335

RARE

UNIVERSITY OF KELANIYA
EXAMS
27 SEP 2004
SRI LANKA

# 1977 න් පසු ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම සහ කොළඹ වරායේ කාර්යභාරය පිළිබඳ විග්‍රහයක්

ආර්.මැල්කම් රීඩ්

ECON/R/139/98

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 335 |
| වර්ග අංකය | |

කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යාපීඨයේ ආර්ථික විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති උපාධි පරීක්ෂණය සඳහා පාර්ශවීය අවශ්‍යතාවය පිණිස ඉදිරිපත් කරන ලදී.

2004 අගෝස්තු

# සාරාංශය


1977 වර්ෂයේදී හඳුන්වා දුන් ආර්ථික ප්‍රතිසංස්කරණයන් මගින් එතෙක් සංවෘතව තිබූ ශ්‍රී ලංකා ආර්ථිකය විවෘත ආර්ථිකයක් බවට පත්වීම සිදුවූ අතර එම ප්‍රතිසංස්කරණයන්ගේ බලපෑම ආර්ථිකයේ සෑම අංශයක් වෙතම ව්‍යාප්ත විය. පුද්ගලික අංශයේ සහයෝගය ඇතිව ශීඝ්‍ර අපනයන සංවර්ධනයක් අත්කර ගැනීම තුළින් ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම එම ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රධාන ඉලක්කයක් විය. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීම නිසා විශේෂයෙන් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාමට සිදුවූ බලපෑම කෙසේ විද? සංවෘත ආර්ථික ක්‍රමය විස්ථාපනය කරමින් හඳුන්වා දුන් විවෘත ආර්ථික ක්‍රමයට අනුගත වන අයුරු විදේශ වෙළඳාම සකස් වීමේදී සිදුවූ ප්‍රධාන වෙනස්කම් මොනවාද? යන්න මෙහිදී විග්‍රහ කෙරේ. එසේම විදේශ වෙළඳාමට ඉතාමත් අත්‍යාවශ්‍ය යටිතල පහසුකමක් වන වරාය කටයුතුවලදී සිදුවූ වෙනස්කම් කවරේ ද? යන්නත් මෙම විග්‍රහයේම කොටසක් වේ.

විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දීමත් සමග අපනයන සහ ආනයන වර්ධන වේගය වඩාත් ශීඝ්‍ර විය. කෘෂිකාර්මික භාණ්ඩ අපනයන මත දැඩිව සංකේන්ද්‍රනයවී තිබූ අපනයන රටාව කාර්මික භාණ්ඩ අපනයන කරන තත්ත්වයට පත්විය. එසේම ආනයන අපනයන දිශාවේද වෙනස්කම් ඇතිවිය. තවද ආනයන සංයුතිය වෙනස් වූවා සේම අපනයන සංයුතිය තුළ විශේෂ වෙනස්කම් රාශියක් සිදුවිය. කෘෂිකාර්මික භාණ්ඩ අපනයන සංයුතිය තුළ සුළු කෘෂිකාර්මික භාණ්ඩ අපනයනයේ වර්ධනයක් ඇතිවූ අතර රබර් අපනයන යම් පිරිහීමකට ලක්විය. එසේම කාර්මික අපනයනයක් ලෙස ඇඟළුම් අපනයනය සුවිශේෂ වර්ධනයක් අත්පත් කර ගන්නා ලදී. විමර්ශනයට ලක්වූ කාලය තුළ වෙළඳ යැපුම් අනුපාතය වර්ධනය වීමත්, වෙළඳ ශේෂයේ හිඟය අඛණ්ඩව වර්ධනය වීමත් දක්නට ලැබුනි. නමුත් 1999 වර්ෂයේදී අපනයන වර්ධනය වේගයත් ආනයන වර්ධන වේගයත් පසුබෑසීමකට ලක්විය. එසේම ඇඟළුම් අපනයනයද විශාල අභියෝග රසකට මුහුණදී ඇත. එය ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම කෙරෙහි ප්‍රබල ලෙස බලපායි.

1979 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවීමත් සමග කොළඹ වරායේ සංවර්ධනය ශීඝ්‍ර විය. අලාභ ලබමින් සිටි කොළඹ වරාය විශාල ලෙස ලාභ ලබන වාණිජ ආයතනයක් බවට පත්විය. කොළඹ වරායට පැමිණි නැව් සංඛ්‍යාව, මෙහෙයුම් කළ නැව්බඩු ප්‍රමාණය, කාර්යක්ෂමතාවය සහ ප්‍රතිඅපනයන ශීඝ්‍ර ලෙස වර්ධනය විය. විදේශ ආධාර මත කොළඹ වරායේ සංවර්ධන කටයුතු කළ අතර නවීන අංගෝපාංග සහිත වරායක් ශ්‍රී ලංකාවට හිමිවිය. නමුත් 1998 සහ 1999 වර්ෂවල සිට කොළඹ වරායේ ප්‍රධාන ආදායම් මාර්ගය වන ප්‍රති අපනයන අංශයේ සහ කාර්යක්ෂමතාවයේ පසුබෑසීමක් වාර්තා විය. එසේම කොළඹ වරායට පැමිණෙමින් තිබූ නැව් සමාගම් වෙනත් වරායන් වෙත යොමුවී ඇත. එසේම කොළඹ වරායේ ජාත්‍යන්තර තරඟකාරිත්වය පිරිහී යමින් පවතී.